සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 13 - 2020

විභාග අංකය .............................

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය දෙකයි

**උපදෙස්:**

- **මෙම ප්‍රශ්න පත්‍රය A ,B හා C යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.**
- **A කොටස 2008 පැරණි විෂය නිර්දේශයට හා 2018 නව විෂයය නිර්දේශයට අදාළව පොදුවේත්, B කොටස පැරණි විෂයය නිර්දේශයට අදාළවත්, C කොටස නව විෂයය නිර්දේශයට අදාළවත් සකස් කර ඇත.**
- **A කොටසට පැරණි හා නව නිර්දේශ යන දෙකටම අදාළ සියලුම සිසුන් පිළිතුරු සපයන්න.**
- **B කොටසට පැරණි විෂයය නිර්දේශයට අදාළ සිසුන් පමණක් පිළිතුරු සපයන්න.**
- **C කොටසට නව විෂයය නිර්දේශයට අදාළ සිසුන් පමණක් පිළිතුරු සපයන්න.**
- **එක් ශිෂ්‍යයෙකු විසින් බහුවරණ ප්‍රශ්න පනහකට පිළිතුරු සැපයිය යුතුය.**

## A කොටස

01. ප්‍රතිචාර, ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සඳහන් නොකළ සන්නිවේදන ආකෘති ඉදිරිපත් කර ඇත්තේ,
    1. හැරල්ඩ් ඩී ලැස්වෙල් හා ශ්‍රාම් ඔස්ගුඩ් ය.
    2. ශ්‍රාම් ඔස්ගුඩ් හා ශැනෝන් විවර් ය.
    3. ශැනෝන් විවර් හා ඇරිස්ටෝටල් ය.
    4. ශ්‍රාම් ඔස්ගුඩ් හා ඇරිස්ටෝටල් ය.
    5. ඩේවිඩ් කේ බර්ලෝ හා ශ්‍රාම් ඔස්ගුඩ්ය.

02. මූලාශ්‍රය පැහැදිලිව හඳුනා ගත හැකි සන්නිවේදන විධික්‍රමය වන්නේ,
    1. විධිමත් සන්නිවේදනයයි.
    2. ලිඛිත සන්නිවේදනයයි.
    3. වාචික සන්නිවේදනයයි.
    4. කථන සන්නිවේදනයයි.
    5. අවිධිමත් සන්නිවේදනයයි.

03. සරත් ලබන වසරේ පැවැත්වීමට නියමිත නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ නිවාස කුටිය ඉදි කිරීම සඳහා විවිධ නිර්මාණාත්මක නිවාස කුටි කිහිපයක ආකෘති ඇන්දේය. ඒ සඳහා ඔහුට උපකාරී වූ සන්නිවේදන වර්ගය වන්නේ,
    1. ලිඛිත සන්නිවේදනයයි.
    2. රූපණ සන්නිවේදනයයි.
    3. දෘශ්‍ය සන්නිවේදනයයි.
    4. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයය.
    5. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.

04. ජනකතා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. යම් සිදුවීමක මුල, මැද, අග යන අංගත්‍රය මනා ලෙස ගළපමින් ඉදිරිපත් කරන කතා විශේෂයකි.
    2. ජන කතා තුළ අන්තර්ගත වන්නේ හාස්‍යෝත්පාදක කතා හා සුරංගනා කතා ය.
    3. ඒ ඒ ජන සමාජවල ජන විඥානයේ ස්වභාවය නිරූපනය කරයි.
    4. ඒ ඒ ප්‍රදේශවල භාෂා ව්‍යවහාරවල පවත්නා ආවේණික ලක්ෂණ හඳුනා ගත හැකි වෙයි.
    5. ලොව සෑම රටකම ප්‍රචලිත සාහිත්‍යාංගයකි.

05. ආච්චී සිය මිනිබිරිය කැඳවා සිය ඇස් පෙනීම දුර්වල බැවින් බණ පොතක් දී එය ශබ්ද නගා කියවන ලෙස පැවසුවාය. මෙහිදී ඇති වූ සන්නිවේදන බාධකය වන්නේ,
    1. ආර්ථ බාධකයි.
    2. පාරිසරික බාධකයි.
    3. දෘශ්‍ය බාධකයි.
    4. මානසික බාධකයි.
    5. මාධ්‍ය බාධකයි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

06. A - ප්‍රතිනිෂ්පාදන තාක්‍ෂණය භාවිතා වීම.
B - තොරතුරු සමාජයකට මූලික අඩිතාලම වැටීම.
C - නිර්මාණවල විශිෂ්ට බව හා ගුණාත්මක බව හීන වීම.
යන ලක්‍ෂණ දක්නට ලැබෙන සංස්කෘතික ප්‍රභේදය වන්නේ,
1. ගෝලීය සංස්කෘතියයි. 2. ජනප්‍රිය සංස්කෘතියයි. 3. මාධ්‍ය සංස්කෘතියයි.
4. සාම්ප්‍රදායික සංස්කෘතියයි. 5. ජන සංස්කෘතියයි.

07. අන් සත්වයන්ගෙන් මිනිසා ගුණාත්මක ලෙස වෙනස් වන බව හඳුනා ගැනීමට උපකාර වන සාධකය වන්නේ,
1. සංස්කෘතියයි. 2. භාෂාවයි. 3. ජාතියයි. 4. ආගමයි. 5. රැකියාවයි.

08. ජනමාධ්‍ය මඟින් ග්‍රාහකයා රඳවා තබා ගැනීම සඳහා ආකර්ෂණීයව සංදේශ ඉදිරිපත් කරයි. ඒවා නිසි පරිදි අර්ථ කථනය කිරීමටත්, අවබෝධ කර ගැනීමටත් අවශ්‍ය වන්නේ,
1. සංජානන හැකියාවයි. 2. විමර්ශනාත්මක හැකියාවයි. 3. විචාරාත්මක හැකියාවයි.
4. සංස්ලේෂණ හැකියාවයි. 5. මාධ්‍ය සාක්‍ෂරතාවයයි.

09. මාධ්‍ය විචාරකයා සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - මාධ්‍ය විචාරකයා, මාධ්‍ය හා ග්‍රාහකයා අතර ගුණාත්මක සම්බන්ධතාවයක් ගොඩ නඟයි.
B - මාධ්‍ය විචාරකයා අනිවාර්යයෙන් ම වෘත්තීය මාධ්‍යකරුවෙක් වෙයි.
C - මාධ්‍ය විචාරකයාට මාධ්‍ය විචාර ප්‍රභේද හා විවිධ මතවාද පිළිබඳ අවබෝධය අවශ්‍ය වෙයි.
D - ග්‍රාහකයා රැක ගැනීමේ අරමුණින් විචාරකයා සංදේශ විචාරය කිරීම අවශ්‍ය වෙයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
1. A හා B ය. 2. C හා D ය. 3. A හා C ය. 4. B හා D ය. 5. A හා D ය.

10. ප්‍රදීපාගාර උපක්‍රමය වඩාත් යෝග්‍ය වන්නේ,
1. මහජන සන්නිවේදනයේ දී ය. 2. සමූහ සන්නිවේදනයේ දී ය.
3. අවාචික සන්නිවේදනයේ දීය. 4. වාචික සන්නිවේදනයේ දී ය.
5. විධිමත් සන්නිවේදනයේ දී ය.

11. ප්‍රථමයෙන් ම බිහි වූ මාධ්‍ය වන්නේ,
1. දුරකතනයයි. 2. ගුවන්විදුලියයි. 3. චලන චිත්‍රයයි. 4. පුවත්පතයි. 5. සිනමාවයි.

12. මුද්‍රිත මාධ්‍ය භාෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. පුවත්පත් ලිපි ප්‍රභේද අතුරින් නිර්මාණශීලී බස් වහරක් භාවිත කරන්නේ විශේෂාංග ලිපිවල පමණි.
2. අනිකුත් මුද්‍රිත මාධ්‍යයන්ට සාපේක්‍ෂව ග්‍රන්ථකරණයේදී භාෂාව කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරයි.
3. ප්‍රවෘත්ති රචනයේ දී නිර්මාණශීලී බස් වහරක් කෙරෙහි අවධානය යොමු නොකෙරේ.
4. පුවත්පත් දැන්වීම්වලදී භාවිතා වන්නේ ග්‍රාහකයා ආකර්ෂණය කරන ඍජු සරල බස්වහරකි.
5. පුවත්පතක වැඩි අවධානයක් යොමු කරන්නේ ප්‍රවෘත්තීවලට වඩා භාෂාවේ නිවැරදි බව කෙරෙහිය.

13. ජනප්‍රිය සංස්කෘතියට අයත් අංගයක් නොවන්නේ,
1. යාන වාහන 2. ඇඳුම් පැළඳුම් 3. ආහාර, පාන 4. ජංගම දුරකතන 5. දැනුම

14. වර්තමානයේ රූපවාහිනී ප්‍රවෘත්ති විකාශන හරහා සිදු වෙමින් පවතින සමාජ විරෝධී ක්‍රියාවන් පිළිබඳව ජනතාව හා බලධාරීන් දැනුවත් කිරීම සිදු වේ. මෙය ආයතනික දෘෂ්ටිකෝණයට අනුව,
1. ජනමාධ්‍යයේ කාර්ය භාරයකි. 2. සමාජීය යුතුකමකි. 3. සමාජීය වගකීමකි.
4. කාලීන අවශ්‍යතාවයකි. 5. ප්‍රජා සත්කාරයකි.

15. ''සංවිධානයක් විසින් ඒ හා බැඳී පවතින මහජනතාව අතර හොඳ හිත හා අවබෝධය ඇති කිරීම හා එය පවත්වා ගෙන යාම සඳහා ගනු ලබන සැලසුම් සහගත මෙන්ම ස්ථිරසාර ප්‍රයත්නය මහජන සම්බන්ධතාවයයි''.
මෙම නිර්වචනය ඉදිරිපත් කරනු ලැබූයේ
1. සැම් බ්ලැක් ය. 2. බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා ආයතනය ය.
3. එඩ්වඩ් එල්. බර්නීස්ය. 4. වෙබ්ස්ටර් නව කොලිජියේට් ශබ්ද කෝෂය ය.
5. චාර්ල්ස් ප්ලැකාඩ් ය.

16. මහජන සම්බන්ධතාවය හා නොගැළපෙන අවස්ථාවක් වන්නේ,
1. රජයේ නව ව්‍යාපෘතියක් පිළිබඳ මහජන මතය විමසීම.
2. වාණිජ මූල්‍ය ආයතනයක් මඟින් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම.
3. ව්‍යාපාරික ආයතනයක් විසින් අනුග්‍රාහකත්වය ලබා දීම.
4. ගෘහ භාණ්ඩ වෙළඳ සැලක් මඟින් වෙළඳ වට්ටම් ලබා දීම.
5. රෙදි පිළි වෙළඳ සැලක නිමි ඇඳුම්වල මිල ගණන් සටහන් කිරීම.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර කියවුම් සොබපාරගමින ශුණමේද අනුගමනය කරමින් සොබය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පකාට කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

17. රජයේ හා පෞද්ගලික ආයතන දෙකකින් මුද්‍රණය කළ ජාතික පුවත්පත් දෙකක මුල් පිටුවේ පළ කර තිබූ ප්‍රවෘත්ති එකිනෙකට වෙනස් විය. එම තත්වය අවබෝධ කර ගැනීමට වඩාත් වැදගත් වන්නේ,
1. මාධ්‍යයේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රායෝගික දැනුමයි.
2. දේශපාලන දර්ශනය පිළිබඳ යථාර්ථවාදී දෘෂ්ටියයි.
3. මාධ්‍ය හිමිකාරත්වය පිළිබඳ විචාරාත්මක අවබෝධයයි.
4. මාධ්‍ය වාර්තාකරණය පිළිබඳ විචාරාත්මක අවබෝධයයි.
5. මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ කාලීන දැනුමයි.

18. නිර්මාණකරුවෙකුට සිය නිර්මාණ කාර්යය සඳහා අත්දැකීම් ලැබෙන ප්‍රධාන ක්‍රම ත්‍රිත්වය වන්නේ කුමක්ද?
1. ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය.
2. සංජානනය, පරිකල්පනය හා ප්‍රත්‍යකරණය.
3. සත්‍යාපනය, ප්‍රදීපනය, ප්‍රජානනය.
4. ස්ව අත්දැකීම්, අන්‍යයන් ලැබූ අත්දැකීම් හා මාධ්‍ය ආශ්‍රිත අත්දැකීම්.
5. ඉන්ද්‍රිය සංවේදනය, පරිකල්පනය, ස්ව අත්දැකීම්.

19. සන්නිවේදනයේ මූලික අරමුණු ඇතුළත් වරණය තෝරන්න.
1. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, පෙළඹවීම හා සහසම්බන්ධයයි.
2. පෙළඹ වීම, අධ්‍යාපනය, තොරතුරු සම්පාදනය හා බලපෑමයි.
3. තොරතුරු සම්පාදනය, අධ්‍යාපනය, පෙළඹවීම හා විනෝදාස්වාදයයි.
4. පෙළඹ වීම, අධ්‍යාපනය, සමාජානුයෝජනය හා තොරතුරු සම්පාදනයයි.
5. විනෝදාස්වාදය, සුපරීක්ෂණය, අර්ථ කථනය හා සහසම්බන්ධයයි.

20. "සංස්කෘතිය" පිළිබඳ ව ඉදිරිපත් කර ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. දැනුම, ඇදහිලි, සිරිත්, විරිත් හැකියා, පුරුදු ඇතුළත් සමස්තයයි.
2. සමාජය එකට බැඳ තබන වටිනාකම්වලින් සමන්විත වෙයි.
3. මානව සබඳතා මත බිහි වී වර්ධනය වූවකි.
4. මිනිසා විසින් මිනිසාගේ ලැදියා හා අවශ්‍යතා ඉටු කිරීමේ අරමුණින් සිදු වන අඛණ්ඩ ක්‍රියාවලියකි.
5. ජනමාධ්‍ය මඟින් උගන්වනු ලබන ඇගයුම් සමූහයයි.

21. ජනමාධ්‍ය වර්ගීකරණය කරනුයේ,
1. ලිඛිත හා කථන මාධ්‍ය ලෙසිනි.
2. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ලෙසිනි.
3. සාම්ප්‍රදායික හා නූතන මාධ්‍ය ලෙසිනි.
4. සාම්ප්‍රදායික හා නව මාධ්‍ය ලෙසිනි.
5. නූතන මාධ්‍ය හා නව මාධ්‍ය ලෙසිනි.

22. සන්නිවේදකයා විසින් ග්‍රාහකයා වෙත යම් සංදේශයක් ලබා දුන් පසු ග්‍රාහකයා තුළ ඇති වන වෙනස.
1. බලපෑමයි.
2. ප්‍රතිපෝෂණයයි.
3. ඉගනුමයි
4. සමාජානුයෝජනයයි.
5. අත්දැකීම් පසුතලයයි.

23. උසස් කලාත්මක හා සෞන්දර්යාත්මක වටිනාකම්වලින් යුත් නිර්මාණ බිහි වූ සංස්කෘතිය වන්නේ,
1. ජන සංස්කෘතියයි.
2. සාම්ප්‍රදායික සංස්කෘතියයි.
3. සම්භාව්‍ය සංස්කෘතියයි.
4. ගෝලීය සංස්කෘතියයි.
5. විධිමත් සංස්කෘතියයි.

24. මාධ්‍ය විචාරයේ මූලික අරමුණක් විය යුත්තේ,
1. මාධ්‍ය සංදේශ විවේචනය කිරීමයි.
2. නිර්මාණකරුගේ නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීමයි.
3. යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමයි.
4. මාධ්‍ය සංදේශවල ගුණ දොස් පෙන්වා දීමයි.
5. ග්‍රාහකයින් ජනමාධ්‍ය වෙත යොමු කිරීමයි.

25.



ලැස්වෙල් ආකෘතියට සමාන වූ ඉහත ආකෘතිය තුළ ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සිදු වන්නේ නම්, එහිදී පණිවිඩය ගමන් කළ යුත්තේ,
1. Q සිට T දක්වා ය.
2. S සිට P දක්වා ය.
3. T සිට Q දක්වා ය.
4. P සිට T දක්වා ය.
5. P සිට S දක්වා ය.

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## B - කොටස

26. නිදහස් මතවාදයට විරුද්ධ ව කටයුතු කළ අයෙකු වන්නේ,
    1. ජෝන් ලොක් ය.
    2. ජෝසප් ගොබෙල්ස්ය.
    3. ස්ටුවර්ට් මිල් ය.
    4. ජෝන් මිල්ටන් ය.
    5. තෝමස් ජෙෆර්සන් ය.

27. රූපණය සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
    1. ඉරියව් හා හැසිරීම්වලින් බිහි වේ.
    2. භාෂාවේ අර්ථ තීව්‍ර කරයි.
    3. ඉබේ හුරු වෙයි.
    4. පුද්ගල බද්ධව සිදු වෙයි.
    5. සංස්කෘතියට විරෝධකල්පයක් ලෙස බිහි වෙයි.

28. මහාචාර්ය ජොහාන් ගැල්ටුන්ගේ ගැටුම් ත්‍රිකෝණයට අයත් අංග වන්නේ,
    1. ආකල්ප, චර්යා හා ප්‍රජානනයයි
    2. ව්‍යුහය, ආකල්ප හා චර්යාවයි.
    3. චර්යාව , පාර්ශවකරුවන් හා ආකල්පයි.
    4. ප්‍රතිභාව, ව්‍යුහය, චර්යාවයි.
    5. විසම්මුතිය, චර්යාව, ප්‍රතිභාවයි.

29. යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදන විධි ක්‍රමයක් වන්නේ,
    1 ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
    2 ශබ්ද විකාශන යන්ත්‍රයයි.
    3 විද්‍යුත් තැපෑලයි.
    4 මයික්‍රෆෝනයයි.
    5 අභිසාරී මාධ්‍යයයි.

30. විකල්ප මාධ්‍ය සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.
    1. සමාජයට විශාල බලපෑමක් කරයි.
    2. මතවාදී කාර්යයට ප්‍රධාන තැනක් ලබා දෙයි.
    3. සමාජ විඥානය කෙරෙහි බලපෑමක් ඇති කරයි.
    4. නව මාධ්‍ය තාක්ෂණය යටතේ පවත්වා ගෙන යනු ලබයි.
    5. ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට පරිබාහිරව ක්‍රියාත්මක වෙයි.

31. රටක සංවර්ධන ක්‍රියාවලියේ දී රජය විසින් අවම අවධානයක් යොමු කළ යුතු කරුණක් වන්නේ,
    1. ස්වයං රැකියා අවස්ථා සම්පාදනය කිරීම.
    2. ණය පහසුකම් සපයා දීම.
    3. සහනාධාර බෙදා දීම.
    4. වෘත්තීය පුහුණු අවකාශ ලබා දීම.
    5. පවත්නා වැඩ ලෝකය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.

32. සංවර්ධන සංදේශයක් ඉතා ඉක්මනින් පිළිගෙන ඊට එකතු වන කණ්ඩායම හඳුන්වන්නේ,
    1. ප්‍රමුඛ අනුගාමිකයින් ලෙසය.
    2 මත නායකයින් ලෙසය.
    3. ක්‍රියාකාරී කණ්ඩායම් ලෙසය.
    4. ප්‍රවර්ධන කණ්ඩායම් ලෙසය.
    5. විශෝධන කණ්ඩායම් ලෙසය.

33. දුටුගැමුණු චරිතය අළලා නිෂ්පාදනය කළ සිනමා පටයක් විචාරය කිරීම සඳහා යෝග්‍ය විචාර ප්‍රවේශය වන්නේ,
    1. සෞන්දර්යාත්මක ප්‍රවේශයයි.
    2. දේශපාලනික ප්‍රවේශයයි.
    3. ඓතිහාසික ප්‍රවේශයයි.
    4. සදාචාරාත්මක ප්‍රවේශයයි.
    5. සංසන්දනය හා විශ්ලේෂණ ප්‍රවේශයයි.

34. Covid - 19 පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් පුවත් පතේ මුල් පිටුවේ පළ කර තිබුණි. එම පුවත් අයත් වන්නේ,
    1. දෘඪ පුවත්වලට ය.
    2. මෘදු පුවත්වලට ය.
    3. ගවේෂණාත්මක පුවත්වලට ය.
    4. කාලීන පුවත්වලට ය.
    5. මාණ්ඩලික පුවත්වලට ය.

35. උප භාෂාවක් සම්බන්ධ **වැරදි** ප්‍රකාශය වන්නේ,
    1. ප්‍රාදේශීය භාෂා ලක්ෂණවලින් සමන්විත වීමයි.
    2. උප සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වීමයි.
    3. සීමිත කණ්ඩායම් අතර භාවිත වීමයි.
    4. ප්‍රධාන භාෂා ධාරාවේ අනුධාරාවක් වීමයි.
    5. උපකාරක භාෂා ලක්ෂණවලින් සමන්විත වීමයි.

36. ගුරුතුමා ඉගැන්වූ ගණිත පාඩම නිමාලි අවබෝධ කර ගැනීමට ගත් උත්සාහයේ දී සිදු වන්නේ,
    1. සංදේශනයයි.
    2. ආකේතිකරණයයි
    3. විකේතිකරණයයි.
    4. සංජානනයයි.
    5. ප්‍රජානනයයි.

37. සම්මන්ත්‍රණ ශාලාවක දේශනයක් පැවැත්වීමට එන කථිකයෙකුට වඩා වැදගත් උපකරණය වන්නේ,
    1. ශබ්ද විකාශන යන්ත්‍රයයි.
    2. රැහැන් රහිත මයික්‍රෆෝනයයි.
    3. මෙගා ෆෝනයයි.
    4. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
    5. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයය.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර නිකුත් කිරීම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

38. රූපවාහිනී මාධ්‍ය තුළ යොදා ගනු ලබන ප්‍රධාන සන්නිවේදන ප්‍රකාශන රටාව වන්නේ,
1. කථනය හා රූපණයයි. 2. විවරණය හා කථනයයි. 3. කථනය හා ශ්‍රවණයයි.
4. ශ්‍රවණය හා රූපණයයි. 5. රූපණය හා ශ්‍රවණයයි.

39. නව මාධ්‍ය භාෂාවෙහි විශේෂ ම ලක්ෂණයක් වන්නේ,
1. ක්ෂණයෙන් ග්‍රහණය වන සරල භාෂාවක් යොදා ගැනීම. 2. ජාත්‍යන්තර භාෂා පමණක් යොදා ගැනීම.
3. පාරිභාෂිත පද භාවිත කිරීම. 4. කෙටි පද, සංකේත ආදිය යොදා ගැනීම.
5. පරිකල්පනීය භාෂාවක් යොදා ගැනීම.

40. මාධ්‍ය විචාරයේ මූලිකාංගයක් නොවන්නේ,
1. මාධ්‍ය නිර්මාණයයි. 2. මාධ්‍ය විචාරකයායි. 3. මාධ්‍ය සංස්කෘතියයි.
4. ග්‍රාහකයායි. 5. මාධ්‍ය නිර්මාණකරුවායි.

41. පුද්ගලයා සමාජානුයෝජනය වන්නේ,
1. අනුකරණය, තදාත්මීකරණය, නවීකරණය තුළිනි.
2. නවීකරණය, භූමිකා නිරූපණය, තදාත්මීකරණය තුළිනි.
3. භූමිකා නිරූපණය, අනුකරණය, ගතික බව තුළිනි.
4. නවීකරණය, ගතික බව, තදාත්මීකරණය තුළිනි.
5. අනුකරණය, තදාත්මීකරණය, භූමිකා නිරූපණය තුළිනි.

42. අහඹු කණ්ඩායමට උදාහරණ අවස්ථාවක් වන්නේ,
1. පන්ති කාමරයේ දී හමුවන ශිෂ්‍ය කණ්ඩායමයි.
2. බස් නැවතුම්පළේදී හමුවන මගීන් කණ්ඩායමයි.
3. වාර්ෂික සැමරුම් උත්සවයේ දී හමුවන ආදි ශිෂ්‍ය කණ්ඩායමයි.
4. අවමංගල්‍යාධාර සමිතියේ දී හමුවන සාමාජික කණ්ඩායමයි.
5. පාසලේ සැලසුම් සකස් කිරීමට රැස් වන කළමණාකරණ කණ්ඩායමයි.

43. ''පුද්ගලයන් දෙදෙනෙකු අතර එක සමාන චිත්ත ස්වභාවයක් ඇති කිරීම සන්නිවේදනයයි'' යනුවෙන් අර්ථ දක්වා ඇත්තේ,
1. විල්බර් ශ්‍රාම් ය. 2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. 3. ශැනෝන් හා වීවර් ය.
4. එඩ්වඩ් සැපියර් ය. 5. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයය.

44. මහජන සම්බන්ධතා වැඩසටහනක සැලසුම් සකස් කිරීමේ දී ප්‍රථමයෙන් කළ යුත්තේ,
1. අය - වැය වාර්තාව සැකසීමයි. 2. මූල්‍ය හා මානව සම්පත් සපයා ගැනීමයි.
3. තත්ව විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනා ගැනීමයි. 4. කාල රාමුව සකස් කිරීමයි.
5. ක්‍රම, විධි, උපාය මාර්ග හඳුනා ගැනීමයි.

45. මහජන සම්බන්ධතා විධික්‍රමයක් වන්නේ,
1. මාධ්‍ය සම්බන්ධතා ය. 2. මුද්‍රිත මාධ්‍ය ය. 3. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ය.
4. ඡායාරූප ය. 5. ප්‍රදර්ශන ය.

46. සමාජීය වශයෙන් ඉතා ඵලදායක වන්නේ,
1. සංස්කෘතික හුවමාරුවයි. 2. සංස්කෘතික ලැග්මයි. 3. සංස්කෘතික ආක්‍රමණයි.
4. සංස්කෘතික සම්පර්කයයි. 5. ගෝලීයකරණයයි.

47. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති යෝජනාවක ඇතුළත් නොකළ යුතු වන්නේ,
1. ඉලක්ක හා අරමුණු දැක්වීමයි. 2. කාර්ය පථය හා සීමා දැක්වීමයි.
3. අය - වැය හා සම්පත් සාධනය පිළිබඳ දැක්වීමයි. 4. ප්‍රතිලාභ තක්සේරු කිරීමයි.
5. පාර්ශවකරුවන් පිළිබඳ තොරතුරු දැක්වීමයි.

48.




ඉහත සංවර්ධන සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කරනු ලැබූයේ,
1. මා ඕ සේතුං ය. 2. මහත්මා ගාන්ධිතුමාය. 3. ලැසාස්ෆෙල්ඩ් ය.
4. නායර් හා වයිට් ය. 5. ඩේවිඩ් කේ. බර්ලෝ ය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

49. ප්‍රවර්ධන මිශ්‍රය තුළ අන්තර්ගත අංග වන්නේ,
1. නිෂ්පාදනය, ප්‍රචාරණය, බෙදාහැරීම හා ප්‍රවර්ධනය යි.
2. නිෂ්පාදනය, පෞද්ගලික අලෙවිය, ප්‍රචාරණය හා ප්‍රවර්ධනය යි.
3. නිෂ්පාදනය, මිල, බෙදා හැරීම හා ප්‍රවර්ධනය යි.
4. ප්‍රචාරණය, ප්‍රසිද්ධිය, මහජන සම්බන්ධතාවය හා පෞද්ගලික අලෙවිය යි.
5. පෞද්ගලික අලෙවිය, ප්‍රචාරණය, ප්‍රවර්ධනය හා මිලයි.

50. ඥාන ගවේෂණයේ ශිල්ප ක්‍රමයක් වන්නේ,
1 සංස්ලේෂණයයි. 2 සංජානනයයි. 3 සංකල්පයි. 4 විනිශ්චයයි. 5 නියාමනයයි.

## C කොටස

26. යුනෙස්කෝ සංවිධානයේ ගෲන්වල්ට් ප්‍රකාශනය මඟින් ඉදිරිපත් කළ නිර්දේශ පිළිබඳ සිසුන් අතර ඇති වූ අදහස් කිහිපයක් පහත දැක්වේ,

A - පෙර පාසල් අවධියේ සිටම මාධ්‍ය අධ්‍යාපනය දරුවන්ට ලබා දෙන්න ඕනෑ.
B - ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන බිහි කරන්නත් ඕනෑ.
C - ඒ වගේම දරුවන් මාධ්‍ය සාක්ෂරතාවයෙන් ද විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය කිරීමේ ඥානයෙන් ද, නිර්මාණශීලී චින්තනයෙන් ද දරුවන් බලසම්පන්න කරන්න ඕනෑ.
D - රූපවාහිනී ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීමෙන් දරුවා ඈත් කරන්න ඕනෑ,

ඉහත ප්‍රකාශ අතුරින් **සත්‍ය** වන්නේ,
1. A හා B ය. 2. B හා C ය. 3. C හා D ය. 4. B හා D ය. 5. A හා C ය.

27. 60 දශකයේ දී මාධ්‍යවේදීන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාවක් හඳුන්වා දී ඇත්තේ,
1. දෙහිවල කනිෂ්ඨ විශ්ව විද්‍යාලය විසිනි.
2. කැළණිය විශ්ව විද්‍යාලය විසිනි.
3. ජනමාධ්‍ය අමාත්‍යාංශය විසිනි.
4. ගුවන්විදුලි සේවය හා ලේක්හවුස් ආයතනය විසිනි.
5. වෘත්තීය පුහුණු අධිකාරිය විසිනි.

28. මහජන සන්නිවේදනයට උදාහරණ අවස්ථාවක් වන්නේ,
1. පාසලක අ.පො.ස. (සා.පෙ.) දරුවන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
2. දහවන ශ්‍රේණියේ සිසුන් සඳහා ධර්ම දේශනාවක් පැවැත්වීම.
3. තම ගම් ප්‍රදේශයේ ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන දරුවන් සඳහා පිරිත් සජ්ඣායනාවක් පැවැත්වීම.
4. අභිනව ගොඩනැගිල්ල විවෘත කළ ජනපතිතුමා ජනතාව ඇමතීම.
5. ''මිණිමිතු'' ළමා සමාජයේ මාසික රැස්වීම පැවැත්වීම.

- **පහත දැක්වෙන්නේ සන්නිවේදන මූලිකාංග කිහිපයකි.**

| | | |
|---|---|---|
| A - නියාමකයෝ | B - බලපෑම | C - සම්ප්‍රේෂකය. |
| D - විකේතකරය | E - ප්‍රතිපෝෂණය | F - බාධක |
| G - ආකේතකරය | H - සංදේශය | |

ඉහත කරුණු ඇසුරින් 29-32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

29. B - මූලිකාංගය ඇතුළත් සන්නිවේදන ආකෘති ඉදිරිපත් කර ඇත්තේ,
1. ශැනෝන්, විවර් හා හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.
2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් හා ඇරිස්ටෝටල් ය.
3. ඇරිස්ටෝටල් හා ශැනන් විවර් ය.
4. ශ්‍රාම් ඔස්ගුඩ් හා ඇරිස්ටෝටල් ය.
5. ශ්‍රාම් ඔස්ගුඩ් හා හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.

30. ශැනෝන් හා විවර් ආකෘතියේ ඇතුළත් අංග දෙකක් වන්නේ,
1. G හා B ය. 2. C හා E ය. 3. C හා H ය. 4. E හා F ය. 5. A හා F ය.

31. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියේ ඇති මූලිකාංග වන්නේ,
1. A, C, E හා D ය. 2. B, E, C හා G ය. 3. G, E, D හා H ය. 4. D, E, F හා A ය. 5. C, E, H හා G ය.

32. HUB ආකෘතියේ ඇතුළත් මූලිකාංග තුනක් වන්නේ,
1. A, B, E ය. 2. B, E, G ය. 3. D, F, A ය. 4. C, E, F ය. 5. A, B, C ය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පිටපත් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP-EXAM

33. ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී,

A - පොදු පණිවිඩ සමූහයක් වෘත්තීය සන්නිවේදකයන් විසින් බහුවිධ ග්‍රාහකත්වයෙන් යුත් පිරිසක් වෙත ඉදිරිපත් කරයි.

B - සංවිධිත ආයතනයක් මඟින් තාක්‍ෂණික මෙවලම් භාවිතයෙන් සුවිශේෂී පිරිසක් වෙත පොදු පණිවිඩ ලබා දෙයි.

C - සමජාතීය ග්‍රාහක පිරිසක් වෙත ක්‍ෂණිකව හා අඛණ්ඩව සංදේශ සම්ප්‍රේෂණය කරයි.

ඉහත ප්‍රකාශ අතුරින්,

1. A පමණක් සත්‍ය වේ. 2. B පමණක් සත්‍ය වේ. 3. C පමණක් සත්‍ය වේ.
4. A හා B පමණක් සත්‍ය වේ. 5. B හා C පමණක් සත්‍ය වේ.

34. ජනමාධ්‍යයේ කාර්ය භාරයක් ලෙස හැරල්ඩ් ඩී. ලැස්වෙල් දක්වා ඇත්තේ,

1. තොරතුරු සම්පාදනයයි. 2. සමාජානුයෝජනයයි. 3.ගුරුවරයෙකුගේ භූමිකාවයි.
4. අර්ථ කථනයයි. 5. සුපරීක්‍ෂණයයි.

35. ගුවන්විදුලි නාට්‍යයක් ශ්‍රවණය කිරීමේ දී අපගේ මනස තුළ නිරූපණය වන රූප හා අවස්ථා මැවීම හඳුන්වන්නේ,

1. චිත්ත රූප ලෙසය. 2. සංකල්ප රූප ලෙසය. 3. ප්‍රදීපනය ලෙසය.
4. පරිකල්පනය ලෙසය. 5. මනඃකල්පිතය ලෙසය.

36. රංග කලාවේ මූලිකාංගයක් වන සාහිත්‍ය මූලිකාංගවලට අයත් වන්නේ,

1. ජවනිකා ය. 2. රංග භාණ්ඩ ය. 3. ප්‍රස්තුත ය. 4. වේෂ නිරූපණය යි. 5. ඇඳුම් ය.

37. වර්තමානයේ බැංකු ගිණුම් හිමියන්ට තම ගිණුම අයත් ඕනෑම බැංකු ශාඛාවකින් මුදල් ගනුදෙනු කිරීමේ පහසුකම් ලැබී ඇත. ඊට හේතු වී ඇත්තේ නව මාධ්‍යවල දක්නට ලැබෙන කිනම් ලක්‍ෂණය නිසාද?,

1. අංකිතකරණය නිසා ය. 2. ජාලගතකරණය නිසා ය. 3. අන්තර්ක්‍රියාකාරිත්වය නිසා ය.
4. අධිපායනීයත්වය නිසා ය. 5. ස්වයංකරණය නිසා ය.

38. අභිසාරීතාවය නව මාධ්‍ය ව්‍යාප්ත වීම කෙරෙහි බලපෑ ප්‍රබල සාධකයකි. අභිසාරීතාවය යනු,

1. භූගෝලීය සීමාවන් ඉක්මවා යන්නකි.
2. ඕනෑම සමාජ මාධ්‍යයකට ඉක්මනින් ප්‍රවේශ වීමට ඇති හැකියාවකි.
3. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය එකම තලයක දී ඒකාබද්ධ වීමකි.
4. වේගයෙන් සංදේශ බෙදා හැරීමේ ඇති හැකියාවකි.
5. මාධ්‍ය ආයතන ජාලගත වීමකි.

39. පිලිප් කොට්ලර් විසින් ඉදිරිපත් කළ සිද්ධි වර්ගීකරණයට අයත් නොවන්නේ.

1. දේශපාලන සිද්ධි 2. සාමූහික සිද්ධි 3. සමාජ හා ජීවන චක්‍ර සිද්ධි
4. ආගමික සිද්ධි 5. ආර්ථික සිද්ධි

40. මාධ්‍ය සාක්‍ෂරතාවයට අදාළ සිද්ධාන්ත තුනක් වන්නේ,

1. ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහය හා කුසලතා ය. 2.පරිහරණය කිරීම, විශ්ලේෂණය කිරීම හා ඇගයීම ය.
3. කියවීම, විචාරය හා අවබෝධය කර ගැනීම ය. 4. ලිවීම, කියවීම හා ඇගයීම ය.
5. නිර්මාණය, ඇගයීම හා විශ්ලේෂණයය.

41. එක්තරා ජනමාධ්‍ය නාලිකාවක් මඟින් ප.ව.7.30 - 10.00 දක්වා කාලය තුළ විකාශනය කෙරෙන ටෙලි නාට්‍ය ඇසුරින් අසන පැනයට පිළිතුරු සපයන ජයග්‍රාහකයන්ට මෝටර් රථයක් ලබා දෙන බව පැවසුවේ ය. මෙය ඇසූ කමල් දිනපතා එම ටෙලි නාට්‍ය නැරඹීමට යොමු විය. ඊට හේතු වූයේ කමල්,

1. මාධ්‍ය ලෝලියෙකු වීමයි. 2. සක්‍රීය ග්‍රාහකයෙකු වීමයි.
3. විචාරශීලී ග්‍රාහකයෙකු වීමයි. 4. නිශ්ක්‍රිය ග්‍රාහකයෙකු වීමයි.
5. නම්‍යශීලී ග්‍රාහකයෙකු වීමයි.

42. මෙරට නිපද වූ ටෙලි නාට්‍යයක ප්‍රධාන චරිතය මෙන්ම සෙසු කාන්තා චරිත කිහිපයක් සිංහල බෞද්ධ සංස්කෘතියට නොගැළපෙන ආකාරයෙන් නිරූපණය කර තිබුණි. එවැනි සංදේශයක් අධ්‍යයනය කිරීමට යෝග්‍ය මානය වන්නේ,

1. සෞන්දර්යාත්මක මානයයි. 2. සදාචාරාත්මක මානයයි.
3. සංජානන මානයයි. 4. චිත්තවේගීය මානයයි.
5. සාක්‍ෂරතා මානයයි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, ඇසුරුම් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NMP EXAM

43. ප.ව. 5.30 ට විකාශනය කෙරෙන කාටූන් වැඩසටහන නැරඹීම සඳහා සඳුනි පාසලේ දුන් සියලු වැඩ ඉක්මනින් අවසන් කළාය. එයින් ප්‍රකාශ වන්නේ,
1. ඇයගේ චර්යාමය වෙනසක් ඇති වූ බවයි.
2. ඉගෙනීමට ඇති රුචිකත්වයයි.
3. මාධ්‍ය සංදේශ ලබා ගැනීමට ඇති රුචිකත්වයයි.
4. මාධ්‍යයේ න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන බවයි.
5. දින චර්යාවේ අංගයක් බවයි.

44. ගෝලීය සංස්කෘතියේ මූලික ම ලක්ෂණය වන්නේ,
1. බහුජාතික සමාගම් මූලික වීමයි.
2. සියලු ජාතික නිෂ්පාදන ප්‍රවර්ධනය වීමයි.
3. සියලු ජාතික සංස්කෘතීන් සමජාතිකරණය වීමයි.
4. අන්තර්ජාල තාක්ෂණයේ ආගමනයයි.
5. සියලු සංස්කෘතීන් සම්මිශ්‍රණය වීමයි.

45. නිෂ්කර්ෂණය යනු,
1. නව මාධ්‍යයේ ලක්ෂණයකි.
2. ජන සන්නිවේදනයේ ප්‍රයෝජනයකි.
3. විචාරශීලී ග්‍රාහකත්ව ලක්ෂණයකි.
4. අතථ්‍ය සන්නිවේදනයේ විශේෂතාවකි.
5. මාධ්‍ය තාක්ෂණික ප්‍රවණතාවයකි.

46. සන්දීපනී නැරඹූ ටෙලි නාට්‍ය තුනක තේමාවන් පහත ආකාර විය.
P - සාතන, මංකොල්ල කෑම් ආදී ප්‍රචණ්ඩ ක්‍රියා ඇතුළත් ටෙලි නාට්‍යයක්
Q - සිය නැන්දම්මාගේ හා සැමියාගේ පීඩනයට ලක් වූ කාන්තාවක් පිළිබඳ ටෙලි නාට්‍යයක්
R - ධන බලය හා නිල බලය ඉදිරියේ අහිංසක, නිර්ධන පුද්ගලයෙකුට මුහුණ පෑමට සිදු වන ගැටලු ඇතුළත් ටෙලි නාට්‍යයක්

ඉහත සංදේශ විචාරය කිරීමට සුදුසු විචාර ක්‍රම පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
1. ස්ත්‍රීවාදී විචාරය, මනෝවිශ්ලේෂණ විචාරය, සෞන්දර්යාත්මක විචාරය.
2. බහුත්වවාදී විචාරය, ස්ත්‍රීවාදී විචාරය, මනෝ විශ්ලේෂණ විචාරය.
3. මාක්ස්වාදී විචාරය, ස්ත්‍රීවාදී විචාරය, මනෝ විශ්ලේෂණ විචාරය.
4. මනෝ විශ්ලේෂණ විචාරය, ස්ත්‍රීවාදී විචාරය, මාක්ස්වාදී විචාරය.
5. මාක්ස්වාදී විචාරය, පශ්චාත් නූතනවාදී විචාරය, මනෝ විශ්ලේෂණ විචාරය.

47. කුරුලෑ බිබිලිවලින් යුත් සුන්දර මුහුණක් කවියා දුටුවේ සඳ මත ඇති ආවාට ලෙසය. එසේ යමක් අපූර්ව ලෙස දැකීමට නිර්මාණකරුවෙකුට ඇති හැකියාව.
1. ප්‍රතිභාව යි.
2. ව්‍යුත්පත්තියයි.
3. සංජානනයයි.
4. පරිකල්පනයයි.
5. සතතාභ්‍යාසයයි.

48.



A B C D

ඉහත A, B, C හා D රූප රාමු පිළිවෙලින් නම් කර ඇති වරණය තෝරන්න.
1. සමීප රූපය, මධ්‍යම රූපය, අතිසමීම රූපය, දුර රූපය.
2. අති සමීප රූපය, සමීප රූපය, මධ්‍ය සමීප රූපය, දුර රූපය.
3. සමීප රූපය, ඉතා සමීප රූපය, මධ්‍යම දුර රූපය, අති දුර රූපය.
4. දුර රූපය, සමීප රූපය, දුර රූපය, අති සමීප රූපය.
5. අති සමීප රූපය, මධ්‍යම දුර රූපය, මධ්‍ය සමීප රූපය, දුර රූපය.

49. ද්වි මාර්ගික සන්නිවේදන ක්‍රමයක් ක්‍රියාත්මක නව මහජන සම්බන්ධතා මෙවලමක් වන්නේ,
1. ඡායාරූප
2. පුවත් හසුන්
3. වීඩියෝ ප්‍රවෘත්ති නිකුත් කිරීම.
4. මහජන මත විමසීම්.
5. වාර්ෂික වාර්තා.

50. මාධ්‍ය නිලධාරියාගේ කාර්ය භාරයක් නොවන්නේ,
1. මාධ්‍ය සම්මන්ත්‍රණ, සාකච්ඡා වෙනුවෙන් පෙනී සිටීම.
2. මාධ්‍ය ඇගයීම් වාර්තා සකස් කිරීම.
3. ආයතනයේ කාර්ය භාරය හා නව දැක්ම පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම.
4. ආයතනයට සම්බන්ධ ලිපි ලිවීම හා මාධ්‍ය වාර්තා ප්‍රකාශන බෙදා දීම.
5. ආයතනය වෙනුවෙන් මහජන සම්බන්ධතා සැලසුම් සකස් කිරීම.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, ඇසුරුම් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ............................

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

කාලය පැය තුනයි

**උපදෙස්:**

- **මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. A කොටස 2008 පැරණි හා 2018 නව විෂයය නිර්දේශ දෙකටම පොදු විෂයය කොටස්වලින් සකසා ඇත.**
- **B කොටසෙහි 4,5,6,7 යන ප්‍රශ්න පැරණි නිර්දේශයට අදාළවත් 8,9,10,11 ප්‍රශ්න නව විෂයය නිර්දේශයට අදාළවත් සකසා ඇත.**
- **නව හා පැරණි නිර්දේශවලට පෙනී සිටින සියලුම සිසුන් A කොටසෙහි ඇති ප්‍රශ්නවලින් 2ක් තෝරා පිළිතුරු සපයන්න. B කොටසෙහි ඇති 4,5,6,7 යන ප්‍රශ්නවලින් ප්‍රශ්න තුනක් තෝරා පැරණි නිර්දේශය හදාරන සිසුන් පමණක් පිළිතුරු සපයන්න.8,9,10,11 යන ප්‍රශ්නවලින් ප්‍රශ්න තුනක් තෝරා නව විෂයය නිර්දේශය හදාරන සිසුන් පමණක් පිළිතුරු සපයන්න.**
- **ඒ අනුව සෑම ශිෂ්‍යයෙකුම ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.**

## A කොටස

01. සන්නිවේදනය අවස්ථානුකූලව, විවිධාකාරයෙන් භාවිතා කෙරේ.

(i) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව ''නිර්මාණශීලීත්වය'' යන්න නිර්වචනය කරන්න. **(ලකුණු 4)**

(ii) විදුහල්පතිතුමා ලබන සිකුරාදා දින පාසල් සංවර්ධන සමිතිය පැවැත්වෙන බව සන්නිවේදන පද්ධතිය හරහා සිසුන්ට දැනුම් දුන්නේය. එම අවස්ථාව තුළ දක්නට ලැබෙන සන්නිවේදන මූලිකාංග හතරක් නම් කර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) මෙම අවස්ථාව තුළ ක්‍රියාත්මක වූ සන්නිවේදන ස්වරූප තුනක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු12)**

(iv) මෙහි දී ක්‍රියාත්මක වූ සන්නිවේදන වර්ගයේ ප්‍රයෝජන හතරක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. **(ලකුණු16)**

02. සන්නිවේදන කාර්යය සඳහා විවිධ මාධ්‍ය යොදා ගැනෙයි.

(i) සාම්ප්‍රදායික මාධ්‍ය දෙකක් හා නූතන මාධ්‍ය දෙකක් නම් කරන්න. **(ලකුණු 4)**

(ii) ගැමි ජීවන රිද්මයේ ස්වභාවය ජනකවි තුළින් නිරූපණය වේ. ජනකවි තුළින් සන්නිවේදනය වන ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම කරුණු තුනක් මඟින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) අද්‍යතනයේ ජනමාධ්‍යයට වඩා, නව මාධ්‍ය භාවිතයට තරුණ පිරිස වැඩි නැඹුරුවක් දක්වයි. ඊට බලපා ඇති හේතු හතරක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. **(ලකුණු 16)**

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

03. ජනමාධ්‍ය සමාජයකට විවිධාකාරයේ බලපෑම් ඇති කරයි.

(i) ජනසන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න. **(ලකුණු 4)**

(ii) මාධ්‍ය සංස්කෘතියෙහි බලපෑම ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපා ඇති ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ තුනක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) වර්තමානයේ ජනමාධ්‍ය මගින් ආකර්ෂණීය ආකෘති ඔස්සේ විවිධ සංදේශ ලබාදෙයි. එවන් අවස්ථාවක විචාරශීලි ග්‍රාහකයෙකු ලෙස ඔබ තුළ වර්ධනය කරගත යුතු නිපුණතා හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 16)**

## <u>B කොටස</u>

04. මානවයාට හුදෙකලාව ජීවත් වීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජය බිහි විය.

(i) සමාජ සංයුතිය තුළ දක්නට ලැබෙන ප්‍රධාන සංවිධාන දෙක නම් කර උදාහරණය බැගින් දක්වන්න. **(ලකුණු 4)**

(ii) සමාජයක බල කේන්ද්‍රය කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. **(ලකුණු 8)**

(iii) වර්තමානයේ ජනමාධ්‍ය සමාජ අරමුණුවලට වඩා වාණිජ අරමුණු ඉටු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බව පෙනේ. කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) පුරවැසියන් විසින් මාධ්‍යකරණයේ නියැලීම නව ප්‍රවණතාවයකි. පුරවැසි මාධ්‍යකරණයේ ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. **(ලකුණු 16)**

05. (i) සිනමා මාධ්‍යයේ ලක්ෂණ හතරක් නම් කරන්න. **(ලකුණු 4)**

(ii) මාධ්‍ය සාක්ෂරතාවයේ ඇති වැදගත්කම කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) මාධ්‍ය වෙළඳ පළෙහි ස්වභාවය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) රූපවාහිනී මාධ්‍ය ගෘහස්ථ සංස්කෘතිය කෙරෙහි බලපා ඇති ආකාරය කරුණු හතරක් මගින් විස්තර කරන්න. **(ලකුණු 16)**

06. (i) ශ්‍රවණ හැකියාව දුර්වල වීමට බලපාන සාධක හතරක් නම් කරන්න. **(ලකුණු 4)**

(ii) ශ්‍රවණ නිපුණතා වැදගත් වීමට හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) තාර්කිකව තීරණ ගැනීම තුළින් පුද්ගලයෙකුට අත්වන වාසි තුනක් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) සිත හසුරුවා ගැනීම වැදගත් වන්නේ ඇයිදැයි කරුණු හතරක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 16)**

07. මිනිසා විසින් නිපදවා ගත් විශිෂ්ඨතම සන්නිවේදන මෙවලම භාෂාව වේ.

(i) ජනමාධ්‍ය තුළ භාෂා භාවිතයේ දී ඇති වන සීමා හතරක් නම් කරන්න. **(ලකුණු 4)**

(ii) භාෂා භාවිත ප්‍රභේද හතරක් නම් කර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) ජීව භාෂාවක ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) නව මාධ්‍ය භාෂාව හැසිරීම තුළ දැකිය හැකිය හැකි ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. **(ලකුණු 16)**

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

08. විසි වන සියවසේ මුල් භාගයෙන් පසු සන්නිවේදන විෂයය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ව්‍යාප්ත විය.

(i) සන්නිවේදන විෂයය ශාස්ත්‍රීය විෂයය ක්ෂේත්‍රයක් බවට පත් කිරීමට පුරෝගාමී වූ පුද්ගලයන් සිව් දෙනෙකු නම් කරන්න. **(ලකුණු 4)**

(ii) මෙම විෂයය ශාස්ත්‍රීය විෂයයක් බවට පත් වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) සන්නිවේදනය සන්දර්භානුගතව සිදුවේ. උදාහරණ අවස්ථා තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) ජනමාධ්‍යයට සුවිශේෂී වූ කාර්ය භාරයන් හතරක් කාලීන නිදසුන් ඇසුරින් විස්තර කරන්න. **(ලකුණු 16)**

09. දෛනික ජීවිතයේ දී මෙන්ම වෘත්තීය ජීවිතයේ දී මිනිසාට නිර්මාණශීලී සන්නිවේදනය වැදගත් වේ.

(i) ගුවන්විදුලි මාධ්‍ය තුළ නිර්මාණශීලී භාෂාව භාවිතයේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න. **(ලකුණු 4)**

(ii) වර්තමානයේ බහුලව භාවිත කරන සමාජ මාධ්‍ය යෙදවුම් හතරක් නම් කර දෙකක් භාවිතයට ගන්නා ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) වර්තමාන සමාජය තුළ ඇතැමුන් සමාජ මාධ්‍ය අයහපත් ආකාරයට භාවිත කරන ආකාරය දැකිය හැකිය. උදාහරණ අවස්ථා තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) නිර්මාණශීලීත්වයේ වැදගත්කම කරුණු හතරක් උදාහරණ මඟින් විග්‍රහ කරන්න. **(ලකුණු 16)**

10. ආයතනයක පැවැත්මට මහජන සම්බන්ධතාවය වැදගත් වේ.

(i) ජේම්ස් ගෲනිස් විසින් ඉදිරිපත් කළ මහජන සම්බන්ධතා ආකෘති හතර නම් කරන්න. **(ලකුණු 4)**

(ii) මානවයා සිය ජීවිතයේ විවිධ සිද්ධි තම නෑදෑ හිතවතුන් සමඟ සමරයි. එවැනි සිද්ධි, කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම කරුණු දෙකක් මඟින් විස්තර කරන්න. **(ලකුණු 8)**

(iii) මහජන සම්බන්ධතාවය දැන්වීම්කරණයෙන් වෙනස් වන ආකාරය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

(iv) ව්‍යාපාරික ආයතන මහජන සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා යොදා ගනු ලබන උපක්‍රම හතරක් නිදසුන් මඟින් විස්තර කරන්න. **(ලකුණු 16)**

11. ඵලදායී මාධ්‍ය සංදේශ බිහි වීමට මාධ්‍ය සාක්ෂරතාවය හේතු වේ.

(i) මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීමේ දී අවධානයට යොමු විය යුතු මූලික කරුණු හතරක් නම් කරන්න. **(ලකුණු4)**

(ii) සංදේශයක් තුළ අන්තර්ගත තොරතුරු ප්‍රභේද දෙක නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

(iii) මාධ්‍ය විචාරය හා සම්බන්ධ පහත අංග වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. **(ලකුණු 12)**

A-මාධ්‍ය හා දෛනික ජීවිතය B-මාධ්‍ය ආර්ථිකය C-මාධ්‍ය ආධිපත්‍ය

(iv) අතථ්‍ය සන්නිවේදනය වර්තමානයේ බහුලව භාවිතයට ගනියි. එම සන්නිවේදනයේ ප්‍රයෝජන හතරක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. **(ලකුණු16)**

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකේජ් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පළමු වාර පරීක්ෂණය - 2020 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

### Iකොටස පිළිතුරු පත්‍රය

### A කොටස

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **02.** - 1 | **03.** - 4 | **04.** - 2 | **05.** - 5 |
| **06.** - 3 | **07.** - 1 | **08.** - 5 | **09.** - 3 | **10.** - 2 |
| **11.** - 4 | **12.** - 2 | **13.** - 5 | **14.** - 1 | **15.** - 2 |
| **16.** - 5 | **17.** - 3 | **18.** - 4 | **19.** - 3 | **20.** - 5 |
| **21.** - 2 | **22.** - 1 | **23.** - 3 | **24.** - 4 | **25.** - 1 |

### B කොටස

| | | | | |
|---|---|---|---|---|
| **26.** - 2 | **27.** - 5 | **28.** - 2 | **29.** - 3 | **30.** - 4 |
| **31.** - 3 | **32.** - 1 | **33.** - 3 | **34.** - 1 | **35.** - 5 |
| **36.** - 3 | **37.** - 2 | **38.** - 1 | **39.** - 4 | **40.** - 3 |
| **41.** - 5 | **42.** - 2 | **43.** - 3 | **44.** - 3 | **45.** - 1 |
| **46.** - 1 | **47.** - 4 | **48.** - 3 | **49.** - 4 | **50.** - 1 |

### C කොටස

| | | | | |
|---|---|---|---|---|
| **26.** - 5 | **27.** - 4 | **28.** - 4 | **29.** - 2 | **30.** - 3 |
| **31.** - 3 | **32.** - 1 | **33.** - 1 | **34.** - 5 | **35.** - 4 |
| **36.** - 3 | **37.** - 2 | **38.** - 3 | **39.** - 5 | **40.** - 1 |
| **41.** - 4 | **42.** - 2 | **43.** - 4 | **44.** - 3 | **45.** - 2 |
| **46.** - 4 | **47.** - 1 | **48.** - 3 | **49.** - 3 | **50.** - 5 |

## II කොටස පිළිතුරු

### A කොටස

01. (i) ''යම් නිමැවුමක් සඳහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් හෝ භාවිත කිරීම නිර්මාණශීලිත්වයයි.
- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය - **(ලකුණු 4)**

(ii) සන්නිවේදකයා, ග්‍රාහකයා, මාධ්‍ය, සංදේශය **(නම් කිරීමට - ල. 2 විස්තර කිරීමට - ල. 3 x 2 = 6)**

(iii) වාචික සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය, විධිමත් සන්නිවේදනය **(ල. 4 x 3 = 12)**

(iv) සමාජීය පොදු කාර්යයන්වලදී ඉවහල් වීම / විවිධ අදහස් යෝජනා දැනගත හැකි වීම / දැනුම සම්පත් ආදිය බෙදා ගැනීමට හැකි වීම / පුද්ගල සන්නිවේදන කුසලතා වර්ධනය කරගත හැකි වීම ආදිය
**(උදාහරණ සහිතව විස්තර කිරීම - ල. 4 x 4 = 16)**

02. (i) සාම්ප්‍රදායික මාධ්‍ය - බෙර, කොළ අතු එල්ලීම, දුම් යැවීම ආදිය
නූතන මාධ්‍ය - පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය **(ලකුණු 2 x 2 - 4)**

(ii) සිතුම්, පැතුම්, ආකල්ප, චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි ආදිය නිරූපණය කිරීම / වෘත්තීමය ස්වභාවය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීම / ඇඳුම් පැළඳුම්, ආහාර පාන පිළිබඳව සන්නිවේදනය කිරීම ආදිය **(ලකුණු 4 x 2 = 8)**

(iii) උපදේශාත්මක සංදේශ ලබා දිය හැකි වීම / අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් කළ හැකි වීම / විනෝදාස්වාදය ලැබීම / භාවයන් ප්‍රකාශ කළ හැකි වීම / දැනුම ලබා දීමට හැකි වීම / සංස්කෘතික අංග හඳුනා ගැනීමට හා හුවමාරු කර ගැනීමට හැකි වීම. **(උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 3 = 12)**

(iv) විවිධ තොරතුරු ලබා ගැනීමට හැකි වීම / ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් තොරතුරු ලබා ගත හැකි වීම / ව්‍යාපාර ගනුදෙනු කිරීමට පහසු වීම මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය එකම මාධ්‍යයක් ඔස්සේ භාවිත කළ හැකි වීම ආදිය.
**(උදාහරණ සහිතව විස්තර කිරීම - ලකුණු 4 x 4 = 16)**

03. (i) තාක්ෂණික මෙවලම් භාවිතය / ක්ෂණික හා අඛණ්ඩ වීම / සංවිධානගත ආයතනික ව්‍යූහයකින් යුතු වීම / වෘත්තීය සන්නිවේදකයන් සිටීම / බහුවිධ දොරටුපාල ක්‍රියාවලියක් පැවතීම / ප්‍රතිපෝෂණය ප්‍රමාද වීම ආදිය
**(ලකුණු 1 x 4 = 4)**

(ii) ප්‍රවෘත්ති හරහා ඝාතන, මංකොල්ල කෑම්, දූෂණය කිරීම් ආදි තොරතුරු ඉදිරිපත් කිරීම / ප්‍රචණ්ඩත්වය සහිත ක්‍රීඩා වැඩසටහන් විකාශනය කිරීම / ගැටුම් සහිත ටෙලි නාට්‍ය චිත්‍රපට ආදිය විකාශනය කිරීම ආදිය.
**(ලකුණු 4 x 2 = 8)**

(iii) ජනමාධ්‍ය මත ව්‍යාප්තිය සිදු වීම / කල්පවත්නා ස්වභාවයක් නොමැති වීම / සෑම සමාජ පන්තියක්ම ආකර්ෂණය වීම / නිෂ්පාදනවල අතිරික්ත බව හා සුලබ බව / නිර්මාණ තුළ බුද්ධිම, සදාචාරාත්මක හා කලාත්මක බව හීන වීම / පොදුවේ ඕනෑම අයෙකුට එම නිර්මාණ රසවිඳීමට හැකි වීම ආදිය **(උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 3 = 12)**

NWE EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iv) මාධ්‍ය සංදේශ විශ්ලේෂණය කිරීමේ හැකියාව / කාණ්ඩකරණය කිරීමේ හැකියාව / ඇගයීමේ හැකියාව / අනුමාන කිරීමේ හැකියාව / නිගමනය කිරීමේ නිපුණතාවය / සංස්ලේෂණය කිරීමේ නිපුණතාවය / වියුක්තිකරණ නිපුණතාවය. **(උදාහරණ සහිතව විස්තර කිරීමට - ලකුණු 4 x 4 = 16)**

## B කොටස

04. (i) ස්වභාවික සංවිධාන - උදා :- පවුල
වාත්තු කරන ලද සංවිධාන - උදා :- බැංකු, රෝහල්, පාසල් ආදිය **(ලකුණු 2 x 2 = 4)**

(ii) සම්පත් හිමිකම / දේශපාලන බලය / අධ්‍යාපනය. **(ලකුණු 4 x 2 = 8)**

(iii) වැඩි වශයෙන් වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීම / ග්‍රාහකයා රඳවා තබා ගැනීමට විවිධ උපක්‍රම භාවිතා කිරීම / වැඩසටහන් සඳහා අනුග්‍රාහකත්වය සපයා ගැනීම / සමාජ අරමුණු ඉටු කිරීම වෙනුවට ග්‍රාහක අවශ්‍යතා ඉටු කිරීම / ජනමාධ්‍ය කර්මාන්තයක් බවට පත් වී තිබීම. **(ලකුණු 4 x 3 = 12)**

(iv) මාධ්‍ය වාර්තාකරණය සඳහා සමාජීය පුරවැසියන් සහභාගී වීම / සිදු වීම් වාර්තාකරණයේ දී අධිපතිවාදී දේශපාලන, ආර්ථික, දෘෂ්ටිකෝණයට වඩා පුරවැසි දෘෂ්ටිකෝණය ඉස්මතු වීම / ජනමාධ්‍ය මගින් අවධානයට ලක් නොවූ සමාජ ආර්ථික දේශපාලනික, සංස්කෘතික ගැටලු ජනතාවට පෙන්වා දීම / ජනමාධ්‍ය , නව මාධ්‍ය යන මාධ්‍ය සියල්ලෙහිම පුරවැසි මාධ්‍යකරණයේ නියැලිය හැකි වීම ආදිය. **(ලකුණු 4x4=16)**

05. (i) ප්‍රබල කලා මාධ්‍යයක් වීම / තාක්ෂණික මාධ්‍යක් වීම/ තම අභිමතය පරිදි නැරඹිය හැකි වීම / අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි ක්‍රියාත්මක වීම / අඳුර සමඟ මුසු වූ මාධ්‍යයක් වීම / ග්‍රාහකත්වය පිළිබඳ සීමා පැවතීම / සංවෘත මාධ්‍යයක් වීම (වෘත්තීන් කිහිපයක් එකට එක්ව සැදුණු මාධයක් වීම.) **(ලකුණු 1 x 4 = 4)**

(ii) තාර්කික හා විචාරශීලී චින්තනය වර්ධනය වීම / නිර්මාණශීලීත්වය වර්ධනය වීම / පුද්ගල හා සමාජ න්‍යාය පත්‍රය යථාර්ථවාදීව සකස් කර ගැනීමට හැකි වීම / මාධ්‍ය සංස්කෘතියේ ස්වභාවය හඳුනා ගැනීමට හැකි වීම. / මාධ්‍ය සංදේශවල උඩු අර්ථ හා යටි අර්ථ හඳුනා ගත හැකි වීම. **(ලකුණු 4 x 2 = 8)**

(iii) ව්‍යාපාරික අවශ්‍යතා මත ගොඩනැගී තිබීම / ලාභය ප්‍රමුඛ කොට ගැනීම / වෙළඳ දැන්වීම් හරහා බලපෑම් කිරීම / මාධ්‍ය තාක්ෂණය මත පදනම් ව ක්‍රියාත්මක වීම / ගෝලීය වෙළඳපලක් නිර්මාණය වීම / නව පරිභෝජන සංස්කෘතියක් බිහි වීම ආදිය. **(ලකුණු 4 x 3 = 12)**

(iv) මානව සබඳතා බිඳ වැටීම / සාමාජිකයන් ගෘහය තුළ හුදෙකලා වීම / මාධ්‍යයට අනුකූල ලෙස සිය දෛනික න්‍යාය පත්‍රය සකස් කර ගැනීම / කෘතීම හා ව්‍යාජ අවශ්‍යතා ගොඩනැගීම / සංවේදීතාවයෙන් තොර පුද්ගලයන් බවට පත් වීම / අධි පරිභෝජන රටාවකට හුරුවීම. **(ලකුණු 4 x 4 = 16)**

06. (i) අවශ්‍යතාවයක් නොමැති වීම / අවධානයක් නොමැති වීම / සංජානන දුර්වලතා / භාෂාව ග්‍රහණය කර ගැනීමේ අපහසුතා ඇති වීම / භාෂාව තේරුම් ගැනීමට අපහසු වීම ආදිය. **(ලකුණු 1 x 4 = 4)**

(ii) යමක් අවබෝධ කර ගැනීමට / නිවැරදි කර ගැනීමට / ශ්‍රවණ බාධා මඟහැර ගැනීමට / නැවත මතක් කර ගැනීමට ආදිය **(ලකුණු 4 x 2 = 8)**

(iii) ගැටලුවක් මතු වූ විට එය නිරාකරණයට අවශ්‍ය සාධක තෝරා බේරා ගැනීමට හැකි වීම/ ප්‍රශස්ත තීරණ ගැනීමට හැකි වීම / විකල්ප තීරණ අතුරින් යෝග්‍ය හොඳම තීරණ ගැනීමට හැකි වීම / ජීවිත සාර්ථක කර ගත හැකි වීම. **(ලකුණු 4 x 3 = 12)**

(iv) සිත නිරන්තරයෙන් ක්‍රියාත්මක වන පද්ධතියක් වීම / නිරන්තරයෙන් හැඟීම් හා සිතිවිලි ඇති වීම / මතකයේ ඇති සිතුවිලි පාලනයකින් තොරව මනසට ගලා ඒම / බාහිර සාධකවලින් මනස නිතරම උත්තේජනය වීම / හැඟීම් සිතිවිලි පාලනය තුළින් චර්යාව පාලනය කිරීමට හැකි වීම ආදිය. **(ලකුණු 4 x 4 = 16)**

07. (i) පුවත්පතක ඉඩකඩ සීමා වීම / ගුවන් විදුලි මාධ්‍යයේදී හැකි තරම් කෙටියෙන් අදහස් ඉදිරිපත් කළ යුතු වීම / රූපවාහිනී මාධ්‍යයේ දී භාෂාව අනවශ්‍ය පරිදි යොදා ගැනීමෙන් රූපමය බව අඩු වීම / ග්‍රාහක සීමාවන් භාෂාවට බලපෑම් කිරීම / සදාචාරාත්මක සීමාවන් නිසා භාෂාව ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතු වීම.
**(ලකුණු 1 x 4 = 4)**

(ii) භාෂණය / රූපණය / විවරණය / කථනය / ලේඛනය **(නම් කිරීමට - ල.2 විස්තර කිරීමට ල. 3 x 2 = 6)**

(iii) භාෂාව අඛණ්ඩව භාවිත වීම / නිරන්තරයෙන් භාෂාව පෝෂණය වීම / භාෂාවේ වචනවලට නව අර්ථ ජනනය වීම / භාෂාවේ වචනවල අර්ථයන් භාවිතය අනුව වෙනස් වීම / සංවේදී ලෙස හා නිර්මාණශීලී ලෙස අදහස් ප්‍රකාශ කළ හැකි වීම ආදිය. **(ලකුණු 4 x 3 = 12)**

(iv) නව මාධ්‍යයන් බොහොමයක් ජාත්‍යන්තර භාෂාවලින් ක්‍රියාත්මක වීම / දේශීය භාෂාවලින් ක්‍රියා කිරීමට නව මෘදුකාංග ඇතුළත් කළ යුතු වීම / ලේඛන කෙටි වීම / ඉංග්‍රීසි අක්ෂර භාවිතයෙන් දේශීය භාෂා ලිවීමේ නව ප්‍රවණතාවයක් ඇති වීම ආදිය **(ලකුණු 4 x 4 = 16)**

08. (i) විල්බර් ශ්‍රාම් / හැරල්ඩ් ඩී. ලැස්වෙල් / කර්ට් ලෙවින් / පෝල් එෆ්. ලැසාස්ෆෙල්ඩ් / කාර්ල් අයිවර් හවුලන්ඩ් / ජෝර්ජ් ගාබ්නර්, වොරන් වීවර් / ක්ලෝඩ් ශැනන්. **(ලකුණු 1 x 4 = 4)**

(ii) කාර්මීකරණය / ජනමාධ්‍යයේ බිහිවීම හා එහි බලපෑම / පළමු හා දෙවන ලෝක යුද්ධයෙන් පසු මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය / විශ්ව විද්‍යාල ආශ්‍රිතව කළ විවිධ පර්යේෂණ ආදිය **(ලකුණු 4 x 2 = 12)**

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) වෘත්තීමය ස්වභාවය අනුව / විවිධ උත්සව අවස්ථා අනුව (මංගල , අවමංගල උත්සව ආදියේ දී) විවිධ පුද්ගල සබඳතා අනුව (දෙමව්පියන්, මිත්‍රයන්, පූජ්‍ය පක්ෂය සමඟ) ආදිය

**(උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 3 = 12)**

(iv) සුපරීක්ෂණය / අර්ථ කථනය / සහ සම්බන්ධය / සමාජානුයෝජනය

**(කාලීන උදාහරණ සමග විස්තර කිරීමට ලකුණු 4 x 4 = 16)**

09. (i) සරල බස්වහරක් යොදා ගැනීම / දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගැනීම / පරිකල්පනීය බස් වහරක් යොදා ගැනීම / එක් වරකින් ශ්‍රවණය කර තේරුම් ගත හැකි භාෂාවක් යොදා ගැනීම / අන්තර් පුද්ගල සන්නිවේදනයට අවකාශ සලසන අයුරින් බස් වහර යොදා ගැනීම ආදිය **(ලකුණු 1 x 4 = 4)**

(ii) Facebook / Twitter / Linkedin / Pinterest / skype / viber / whatsApp ආදිය

**(නම් කිරීමට - ල. 2 විස්තර කිරීමට ලකුණු 3 x 2 = 6)**

(iii) මානසික අවපීඩන, කනස්සල්ල, දිවි නසා ගැනීම් වැනි ගැඹුරු මානසික හා සමාජීය කම්පන ඇති කිරීම / අයහපත් සමාජ සංස්කෘතීන් බිහි කිරීම (උදා. Facebook සාද ආදිය) / වංචා දූෂණ කටයුතු සඳහා යොදා ගැනීම ආදිය **(උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 3 = 12)**

(iv) දෛනික ජීවිතයේ පැවැත්මට / ගැඹුරු සංකල්ප හා දර්ශනවාද පහසුවෙන් වටහා ගැනීමට / සම්මත ඇවතුම් පැවතුම් ඇති වැසියන් සක්‍රීය පුරවැසියෙකු බවට පත් කිරීමට / සතුට සැහැල්ලුව අධ්‍යාත්මික ප්‍රබෝධය ආදිය ඇති කර ගැනීමට / අන්තර්වර්ති, අන්තර්පුද්ගල, සමූහ, ජන, අතථ්‍ය ආදී සන්නිවේදන වර්ග තුළ ප්‍රබල සන්නිවේදකයෙකු වීමට **(උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 4 = 16)**

10. (i) පුවත් නියෝජිත (ප්‍රචාරණ) ආකෘතිය / මහජන තොරතුරු ආකෘතිය /ද්වි මාර්ගික අසමමුහුර්ත ආකෘතිය / ද්වි මාර්ගික සමමුහුර්ත ආකෘතිය. **(ලකුණු 1 x 4 = 4)**

(ii) ආයතනික හොඳ හිත හා ප්‍රතිරූපය වර්ධනය කිරීමට / කාලය කළමනාකරණය කර ගැනීමට / මූල්‍ය කළමනාකරණයට / අර්බුධකාරී තත්ව කළමනාකරණයට / මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීමට / ආයතනික පාර්ශවකරුවන් දිනා ගැනීමට හා රඳවා ගැනීමට **(ලකුණු 4 x 2 = 8)**

(iii) මහජන සම්බන්ධතා කාර්ය කළමනාකාර්යයක් වන අතර දැන්වීම්කරණය අලෙවිකරණ කාර්යයක් වීම. / මහජන සම්බන්ධතා මඟින් සම්බන්ධතා වර්ධනය වීම, දැන්වීම්කරණය මඟින් අලෙවිය සඳහා පෙළඹවීමක් සිදු වීම / මහජන සම්බන්ධතා දිගු කාලීන ක්‍රියාවලියක් වීම - එනම් මහජන සම්බන්ධතා උපාය මාර්ග ආරම්භ කර එය අවසානය තෙක්ම පවත්වා ගෙන යයි. දැන්වීම්කරණය කෙටිකාලීන ක්‍රියාවලියක් වීම - එනම් භාණ්ඩ අලෙවියෙන් පසු දැන්වීම් ප්‍රචාරණය අවසන් වීම / මහජන සම්බන්ධතා සෑම ආයතනයකටම අවශ්‍ය වන අතර දන්වීම්කරණ සෑම ආයතනයකටම අවශ්‍ය නොවීම. **(ලකුණු 4 x 3 = 12)**

(iv) විවිධ තරග පවත්වා ත්‍යාග ලබා දීම / මුදල් ලබා දීම / ජනප්‍රිය චරිත යොදා ගැනීම / විදේශ සංචාර ලබා දීම / වෙළඳ වට්ටම් ලබා දීම / අනුග්‍රාහකත්වය දැක්වීම / දන්සැල් ආදිය පැවැත්වීම.

**(නිදසුන් සහිතව විස්තර කිරීමට ලකුණු 4 x 4 = 16)**

11. (i) අර්ථය / අදාළ බව / පෙළඹවීම / පක්ෂපාතිත්වය / විශ්වසනීයත්වය / විකෘතිකරණය / සඵලතාවය / ශූර මෙහෙය වීම / ඒකාකාරභාවය / ඇගයීම. **(ලකුණු 1 x 4 = 4)**

(ii) තත්ව තොරතුරු (යථා තොරතුරු) - අර්ථය තහවුරුවූත්, සකස් කලාවූත් තොරතුරු වේ. උදා :- නිල ලත් තොරතුරු

සමාජීය තොරතුරු - සත්‍ය ලෙස තහවුරු නොවූ තොරතුරු වේ. උදා :- නිල නොලත් තොරතුරු

**(ලකුණු 4 x 2 = 8)**

(iii) මාධ්‍ය ආර්ථිකය - මාධ්‍යයේ පැවැත්මට මුදල් අවශ්‍ය බවත් ඒ සඳහා දැන්වීම්කරණය හා අනුග්‍රාහකයන් යොදා ගන්නා ආකාරයත් විස්තර කළ යුතුය.

මාධ්‍ය හා දෛනික ජීවිතය - බොහෝ පුද්ගලයන් සිය දෛනික න්‍යාය පත්‍රය මාධ්‍යයට අනුව සකස් කරගෙන ඇති ආකාරය පැහැදිලි කළ යුතුය.

මාධ්‍ය සංදේශ ආධිපත්‍ය - ආර්ථික, දේශපාලනික, සංස්කෘතික බලවේග මත ක්‍රියාත්මක වන ආකාරය විස්තර කළ යුතුය. **(ලකුණු 4 x 3 = 12)**

(iv) සම්බන්ධතා ගොඩනැගීම / අධ්‍යාපනයට උපකාරී වීම / ව්‍යාපාර කටයුතු කිරීම / ප්‍රචාරණ කටයුතු සිදු කිරීම / නිර්මාණාත්මක කාර්ය සඳහා චින්තනය පුබුදුවා ලීම ආදිය.

**(උදාහරණ සහිතව විස්තර කිරීමට - ලකුණු 4 x 4 = 16)**

NWP-EXAM



මෙම ප්‍රශ්න පත්‍ර නියැලුම් සොබාදහමිත ශ්‍රමවේද අනුගමනය කරමින් සොබිත අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පසොට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

## 075 699 9990

**WWW.LOL.LK**

☰ LOL.lk
Learn Ordinary Level

0

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11 ›
- Grade 06, 07 & 08 ›
- Grade 04 & 05 ›
- Grade 01, 02 & 03 ›
- About Us ›
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

☐ GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00